# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 මාර්තු මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018. 03. 14 දින නිකුත් කරන ලදී)

# කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : 2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස හිමිකම් ඇති තැනැත්තන්ට එසේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි කාලසීමාව දීර්ඝ කරනු පිණිස එම පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

## කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්. ඩී.— ඕ. 39/2017

**2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි " මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු වසර දෙකක් තුළ" යන වචන වෙනුවට "මේ පනත ක්‍රියාත්මක වන දින සිට වසර හතරක් තුළ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ පැති සටහනෙහි "මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර දෙකක් තුළ" යන වචන වෙනුවට "මේ පනත ක්‍රියාත්මක වන දින සිට වසර හතරක් තුළ" යන වචන ආදේශ කිරීමෙන්.

2016 අංක 5 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.